# Character designing නිර්මාණ තරඟාවලිය

## ➢ විනිශ්චය මණ්ඩලය

- ඉසුරු හතුරුසිංහ මහතා

තරඟයට සහභාගි වන සියළු දෙනා තරඟ නීති රීති සියල්ල හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.

- නියමිත දිනට පෙර අප වෙබ් අඩවියෙහි ලියාපදිංචි වී අංකයක් ලබා ගත යුතුය.
- ඕනෑම මොහොතක ඔබේ නිමර්ාණය සිදු කළ මුල් පිටපත් ලබා දීමට සූදානම්ව සිටිය යුතුය.(Upload කිරීමේදී Source file ලබා දීම සිදු නොකරන්න)
- එක් අයෙකුට තරගාවලිය සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- ඔබ ඉදිරිපත් කරන Character එකෙහි Full Figure Drawing එකක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
- පසුබිම් නිර්මාණයක් සිදුවන්නේ නම් එය අදාල චරිතය නිරූපණයට බාධාවක් සිදු නොවන ලෙස නිර්මාණය විය යුතුය.
- මෙහිදී ඔබේ නිර්මාණශීලිත්වයට ඉඩ දීම සඳහා අප විසින් ඔබගේ නිර්මාණය සිදු කිරීමට යොදා ගන්නා software සඳහා සීමාවක් පනවන්නේ නැති අතර ඔබට ඕනෑම software එකකින් නිර්මාණය සිදුකල හැක. **(AI Generators භාවිතා කළ නොහැකිය.)**
- ඔබගේ නිර්මාණ JPEG හෝ PNG ආකාරයට ඉදිරිපත් කල හැකිය. නිර්මාණයේ resolution 960px * 1280px වඩා වැඩි විය යුතු අතර ධාරිතාවය 20MB වට වඩා අඩු විය යුතුය.
- ඉදිරිපත් කරන නිර්මාණය තමන්ගේම විය යුතු අතර වෙනත් නිර්මාණයකින් Trace කිරීම හෝ නිර්මාණය වෙනත් අයෙකුගේ බව තහවුරු වුවහොත් තරගාවලියෙන් ඉවත් වීමට සිදු වේ.
- දේශපාලනය, ආගම්වාදය හා සමාජයට හානිකර නිර්මාණයක් විනිශ්චය සඳහා ඉදිරිපත්කරනු නොලබන අතර ඒවා තරඟයෙන් ඉවත් කරනු ලැබේ.

- ඉදිරිපත් කරන සියළුම නිර්මාණ තුල character එකෙහි අනන්‍යතාවය (නම සහ විස්තරයක් නිර්මාණය ඇතුලත ඉදිරිපත් කිරීමට අවසර ඇත) හැර කිසිදු ආකාරයේ ලාංඡන (logo), කතෘ අයිතිය සම්බන්ධ සලකුණු (copyright marks), හෝ වෙනත් කිසිදු ආකාරයේ සළකුණු නොතිබිය යුතුය.

- නිර්මාණාත්මකම හා ජනප්‍රියතම නිර්මාණය ලෙස තරඟ කාණ්ඩ දෙකකින් තරඟය සමන්විත වන අතර සියළුම නිර්මාණ තරඟ කාණ්ඩ දෙකට අඩංගු වේ.

- නිර්මාණාත්මකම නිර්මාණය විනිශ්චය මණ්ඩලය මගින් තෝරාදෙන අතර ජනප්‍රියම නිර්මාණය සඳහා නිර්මාණයට හිමිවන මනාප (facebook likes) මගින් තෝරාගනු ලැබේ.

- විනිශ්චය මණ්ඩලය මගින් අවසාන තීරණය ලබා දෙනු ලැබේ.

- ඔබගේ නිර්මාණය JPEG හෝ PNG ලෙස තනි ගොනුවක් ලෙසත්, නිර්මාණය පිලිබඳ කෙටි හැඳින්වීම සිංහල හෝ ඉංග්‍රීසි බසින් (වචන 50 කට නොවැඩි)(character name and description about the character) pdf එකක් ලෙසත් පැහැදිලිව සඳහන් කර ඉහත සඳහන් සියලුම ගොනු ලියාපදිංචි අංකය නමින් නම් (Rename) කරන ලද තනි zip / rar ගොනුවක් ලෙස උඩුගත කල යුතුය.

- ඔබගේ නිර්මාණය උඩුගත කිරීමේදී ඔබේ නිර්මාණයේ layers වල screenshot කිහිපයක් නිමර්ාණය සමග උඩුගත කිරීම **අත්‍යවශ්‍ය වේ.**

- උඩුගත කිරීමට ප්‍රථම (https://rusara2023.github.io/official/) ඇති google ෆෝරමය පුරවා ඒ හරහා Zip ගොනුව උඩුගත කළ යුතුය.